# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

පළමු වාරය

## ශ්‍රව්‍ය ගොනු සමග වැඩ කරමු

වැඩිදුර ඉගෙනුම් මොඩියුල



**6 ශ්‍රේණිය**

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - පළමු වාරය, ශ්‍රව්‍ය ගොනු සමඟ වැඩ කරමු
වැඩිදුර මොඩියුල (සි) - 6 ශ්‍රේණිය
தகவல் மற்றும் தொடர்பாடல் தொழினுட்பவியல்
கேட்பொலிக் கோப்புகளுடன் பணிபுரிவோம்
முதலாம் தவணை - மேலதிகக் கற்றலுக்காக (சி) - தரம் 06
SC06FL1S - 2026/70-SPC/85,300

තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.ac.lk

මුද්‍රණය සහ බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

## ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා
ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති
අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ
අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ
අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද වීඩියෝ ඊ - තක්සලාව වෙබ් අඩවිය හා යූටියුබ් චැනලය මඟින් නැරඹිය හැකිය.
கல்வி வெளியீட்டுத் திணைக்களத்தினால் ஆக்கப்பட்ட வீடியோக்களை e-Thaksalawa இன் இணையத்தளம் மற்றும் youtube அலைவரிசைகளினூடாகப் பார்வையிட முடியும்.
Videos produced by the Educational Publications Department can be viewed via the website and the YouTube channel of e – thaksalawa.

The National e-Learning Portal for The General Education

https://www.e-thaksalawa.moe.gov.lk/

https://youtube.com/c/ethaksalawa-official

නැණස TV | நெனச TV

https://moe.gov.lk/students/nenasa-tv/

අන්තර්ක්‍රියාකාරී පාඩම්, වීඩියෝ පාඩම්, ශ්‍රව්‍ය ඉගෙනුම් ආධාරක, ක්‍රියාකාරකම් පත්‍රිකා, මාර්ගගත ප්‍රශ්නාවලි, පෙළපොත, අධ්‍යාපනික විනෝදාත්මක වැඩසටහන්, මාර්ගගත පාඨමාලා ඇතුළු තවත් අධ්‍යාපනික වැඩසටහන් සඳහා පිවිසෙන්න.
ஊடாடும் பாடங்கள், வீடியோப் பாடங்கள், செவிப்புல கற்றல் உதவிகள், செயலட்டைகள், நிகழ்நிலை வினாக்கள், பாடநூல்கள், கல்விசார் பொழுதுபோக்கு நிகழ்ச்சிகள், நிகழ்நிலை பாடநெறிகள் உட்பட மேலும் கல்விசார் நிகழ்ச்சிகளின் நிமித்தம் பிரவேசியுங்கள்.
Access for interactive lessons, video lessons, audio learning aids, activity sheets, online quizzes, textbooks, educational entertainment programs, online courses and more educational programs.

National Institute of Education
ChannelNIE

ජාතික අධ්‍යාපන ආයතනය
தேசிய கல்வி நிறுவகம்

වීඩියෝ වැඩසටහන්, පෙරහුරු ප්‍රශ්න පත්‍ර, ප්‍රායෝගික පරීක්ෂණ සහ සම්පත් පොත් යනාදී වටිනා අධ්‍යාපනික සම්පත් සඳහා පිවිසෙන්න
வீடியோ நிகழ்ச்சிகள், பயிற்சி வினாத்தாள்கள், செய்முறைச் சோதனைகள், வளநூல்கள் போன்ற பெறுமதியான கல்விவளங்களுக்காக பிரவேசியுங்கள்
Visit us for valuable educational resources; video programs, practice question papers, practical tests and resource books

අපේ රටේ දරු පරපුර වෙනුවෙන් රජයෙන් ඔබට ලැබුණු මේ මොඩියුලය
ලබන වසරේ දී ත් ඔබ සහෝදර සහෝදරියනට ලබා දීමට හොඳින් පාවිච්චි කරන්න

පාසලේ නම : ..............................................................................................

| | මොඩියුලය ලබා ගත් ශිෂ්‍යයාගේ / ශිෂ්‍යාවගේ නම | ශ්‍රේණිය | පන්ති භාර ගුරුතුමාගේ / ගුරුතුමියගේ අත්සන |
|---|---|---|---|
| 2026 | | | |
| 2027 | | | |
| 2028 | | | |
| 2029 | | | |

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

පළමු වාරය

## 6 ශ්‍රේණිය

තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.ac.lk

මුද්‍රණය හා බෙදා හැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - 6 ශ්‍රේණිය

පළමු වාරය

වැඩිදුර අධ්‍යයන මොඩියුල

ශ්‍රව්‍ය ගොනු සමග වැඩ කරමු

ප්‍රථම මුද්‍රණය - 2025

© ජාතික අධ්‍යාපන ආයතනය
ප්‍රකාශනය : ජාතික අධ්‍යාපන ආයතනය

ISBN 978 - 624 - 5729 - 73 - 9

තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය - www.nie.ac.lk

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ
මුද්‍රණය කරවන ලදී.

Published by : National Institute of Education
Printed by : State Printing Corporation, Panaluwa, Padukka.

## ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පරිවර්තනීය ප්‍රතිසංස්කරණ ප්‍රයත්නය සෑම ඉගෙනුම්ලාභියකුගේ ම අවශ්‍යතා සපුරාලීම සඳහා තීරණාත්මක මාවතක් අරමුණු කර ඇත.
නිපුණතා පාදක ඉගෙනුම, විචාරාත්මක චින්තනය, නිර්මාණශීලීත්වය, 21වන සියවසේ කුසලතා, තාක්ෂණික නැඹුරුව, සදාචාරාත්මක පුරවැසිභාවය වැනි බොහෝ අංශ අවධාරණය කිරීමට හැකි වන පරිදි විෂය මාලාව, ඉගෙනුම්ඉගැන්වීම් ක්‍රම සහ තක්සේරු පිළිවෙත් යනාදිය නවීකරණය මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙහි පදනම විය.

අධ්‍යාපනඥයින්, අන්තර්වෛෂයික විද්වතුන්, ගුරුවරුන් සහ විවිධ පාර්ශ්වකරුවන් සමග සහයෝගී සංවාදයක් හරහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් 2026 වර්ෂයේ සිට 1 හා 6 ශ්‍රේණිවල ක්‍රියාත්මක කිරීමට යෝජිත විෂයමාලා හා අදාළ ඉගෙනුම් ද්‍රව්‍යවල ගුණාත්මක බව සහතික කිරීම සඳහා විශේෂ උනන්දුවක් ගෙන කටයුතු කළ ගරු අග්‍රාමාත්‍යතුමිය, අධ්‍යාපන ලේකම්තුමා, අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන්, විෂය භාර නිලධාරීන්, විභාග කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය, අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය දැක්වූ දායකත්වය අති මහත් ය.

එමෙන්ම, මෙම කාර්යයේ දී සුවිශේෂ කැපවීමක් සිදු කළ ජාතික අධ්‍යාපන ආයතනයේ පාලක සභාවේ හා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ කැපවීම ද ගෞරව පූර්වක ස්තුතියෙන් සිහිපත් කරමි. මෙම කාර්යය සාක්ෂාත් කර ගැනීමට ඉමහත් ලෙස කැප වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සියලු කාර්ය මණ්ඩලයට ජාතියේ ගෞරවය හිමි විය යුතු බව සඳහන් කරමි.

මහාචාර්ය මංජුලා විතානපතිරණ
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
2025.08.11

## අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය

වර්තමානය වන විට ලෝකය ශීඝ්‍ර දියුණුවක් කරා පියනගමින් සිටින්නේ ය. ඒ හා සමගාමී ව පාසල් සිසු සිසුවියන්, නූතන ලෝකයේ අභියෝගවලට මුහුණ දීමට අවශ්‍ය කුසලතාවලින් සන්නද්ධ කරවීම අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුතු සැමදෙනාගේම පරම වගකීමකි. ඒ අනුව යමින් 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක නව විෂයමාලාවට අදාළ මොඩියුල පාදක ඉගෙනුම් ක්‍රමවේදය මෙසේ හඳුන්වා දීමට අවස්ථාව ලැබීම සුවිශේෂ ජයග්‍රහණයක් බව මෙහිලා උදක්ම සඳහන් කළ යුතු ය.

සෑම විෂයක් සඳහා ම විශේෂයෙන් සකස් කර ඇති මෙම ඉගෙනුම් ආධාරක, විචාරශීලී චින්තනය මුවහත් කර ගනිමින් සංකීර්ණ ගැටලුවලට නිර්මාණාත්මක විසඳුම් සොයා ගැනීම, විවිධ කෝණවලින් කරුණු විශ්ලේෂණය කිරීම සහ තර්කානුකූල තීරණ ගැනීම ආදි කුසලතා ශක්තිමත් කර ගැනීම විෂයයෙහි මනා පිටිවහලක් වනු ඇතැයි විශ්වාස කරමි.

ගුණ නැණ සපිරි සිසු පරපුරකගේ සුබ සිහින සැබෑ කරන්නට මෙම ඉගෙනුම් ආධාරක ආලෝකයක් කර ගන්නා ලෙස ඔබ සැමගෙන් ඉල්ලා සිටිමි. මොඩියුල හා ක්‍රියාකාරකම් පොත් සම්පාදනය කිරීමේ විශිෂ්ට කාර්යය සඳහා අප්‍රමාණ දායකත්වයක් සැපයූ සියලු දෙනා වෙත මාගේ කෘතවේදී ස්තුතිය ප්‍රකාශ කරමි. .

ඩී. ඒ. සුභාෂිණී දෙමටගොඩ
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
ඉසුරුපාය,
බත්තරමුල්ල.
2025.08.11



2. ර.මු.නි.ස. 250817

# පෙරවදන

සමස්ත පාසල් විෂයමාලාව සඳහා හඳුනා ගෙන ඇති පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර, නිරන්තරයෙන් වෙනස් වන රටක සහ ලෝකයක, තිරසර සංවර්ධනය කෙරෙහි වන අභියෝග ජය ගැනීමට එම ජාතියට ඇති හැකියාව පිළිබිඹු කරයි. එමෙන් ම කලින් කලට වෙනස් වන ඉල්ලුම්වලට ගැළපෙන සේ පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර ද හඳුනා ගෙන ඇත. එසේ ම පවතින පාසල් විෂයමාලාවෙහි විෂයන් නවීකරණය වන අතර ම නව විෂයන් පාසල් විෂයමාලාවට හඳුන්වා දීම සිදු කරයි. මෙම සිදු වන වෙනස්කම්වලට අනුරූප ව ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය ද කාලානුරූප ව සංවර්ධනය විය යුතු ය. ඒ අනුව 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන නව විෂයමාලාවට අදාළ ව සෑම විෂයක් සඳහා ම ඉගෙනුම පාදක ව මොඩියුල හඳුන්වා දී ඇත.

2026 වර්ෂයේ දී 1 සහ 6 ශ්‍රේණි සඳහාත් 2027 වර්ෂයේ දී 2 සහ 7 ශ්‍රේණි සඳහාත් 2028 වර්ෂයේ දී 3 සහ 8 ශ්‍රේණි සඳහාත්, 2029 වර්ෂයේ දී 4 සහ 9 ශ්‍රේණි සඳහාත්, 2030 වර්ෂයේ දී 5 ශ්‍රේණිය සඳහාත් ප්‍රාථමික අධ්‍යාපන ශ්‍රේණි සහ කනිෂ්ඨ ද්විතීයක ශ්‍රේණි සඳහා නව විෂයමාලා හඳුන්වා දීමට නියමිත ය. කනිෂ්ඨ ද්විතීයක අධ්‍යාපන අවධියේ සිට නව ඉගෙනුම් ක්‍රමවේද ඇතුළත් මොඩියුල සකස් කර ඇති අතර ඉගෙනුම්ලාභියාට අවශ්‍ය මග පෙන්වීම ගුරුවරයාගෙන් බලාපොරොත්තු වන අතර ස්වයං ඉගෙනුම සඳහා අවශ්‍ය පරිසරය මෙම මොඩියුලවලින් සලසා ඇත. ශිෂ්‍යයන්ට අවශ්‍ය සංකල්ප පිළිබඳ දැනුම මෙන් ම ලබා ගත් දැනුම භාවිත අවස්ථාවන්ට යොමු කර ශිෂ්‍ය හැකියා සංවර්ධනයට මෙම මොඩියුල බෙහෙවින් උපකාරී වන බව අපගේ විශ්වාසයයි. 21 වන සියවසේ කුසලතා වන සාක්ෂරතා, අන්තර්පුද්ගල හැකියා සහ අගයන් ආදිය මනා ලෙස ශක්තිමත් කිරීමට මෙම මොඩියුලවලින් ලැබෙන ඉගෙනුම ඉවහල් වනු ඇත.

නව තාක්ෂණය භාවිතයට අවශ්‍ය මග පෙන්වීම සෑම මොඩියුලයක ම දක්වා ඇත. තව ද ශිෂ්‍යයන්ට තමා ළඟා කර ගත් කාර්ය සාධන සහ අධ්‍යාපන අරමුණු පිළිබඳ ව විනිවිද භාවයෙන් ඇගයීමට අවශ්‍ය තක්සේරු උපකරණ ලබා දෙනු ඇත. සෑම විට ම නව හැකියා, දැනුම භාවිත අවස්ථාව සඳහා යොදවමින් යථාර්ථවාදී ඉගෙනුමකට අවශ්‍ය මග පෙන්වීම ලැබෙන ආකාරයෙන් මොඩියුල නිර්මාණය කර ඇත. විශේෂයෙන් ම මොඩියුල පාදක ඉගෙනුම් ක්‍රමවේද සකස් කිරීමට මූලික කටයුතු කළ අධ්‍යාපන අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරුන්ගේ හා ජාතික අධ්‍යාපන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ සේවාව ඉතා අගය කරමි. තව ද මෙම මොඩියුල සකස් කිරීමේ දී දායක වූ ආයතනයේ සියලු ම කාර්ය මණ්ඩලයට ද ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, අධ්‍යක්ෂවරුන් මෙන් ම රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ලබා දෙන ලද දායකත්වය මොඩියුල ගුණාත්මක ව ඉහළ මට්ටමකට සංවර්ධනය වීමට ඉවහල් වූ බව ඉතා සතුටින් සිහිපත් කරමි. මෙම මොඩියුල පරිහරණය කිරීමේ දී ඔබ ලබන අද්දැකීම් සහ යෝජනා අපට ඉතාමත් වැදගත් වන බැවින් ඉදිරි මොඩියුල සංවර්ධනය කිරීමට ඔබගේ අදහස් හා යෝජනා අප වෙත ලබා දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

**කේ. රංජිත් පත්මසිරි**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
විද්‍යා හා තාක්ෂණ පීඨය
2025. 08. 08

## උපදේශනය, රචනය සහ සංස්කරණය

**උපදේශනය** : මහාචාර්ය මංජුලා විතානපතිරණ මිය,
අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය.

කේ. රංජිත් පත්මසිරි මයා,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
විද්‍යා හා තාක්ෂණ පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය.

**අධීක්ෂණය** : එස්. ශංමුගලිංගම් මයා,
අධ්‍යක්ෂ,
තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව,
විද්‍යා හා තාක්ෂණ පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය.

**විෂය සම්බන්ධීකරණය** : එම්. එන්. පී. මද්දුමගේ මිය, කථිකාචාර්ය,
තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව,
විද්‍යා හා තාක්ෂණ පීඨය,
ජාතික අධ්‍යාපන ආයතනය.

**ලේඛක මණ්ඩලය**

**අභ්‍යන්තර** : එම්. එන්. පී. මද්දුමගේ මිය, කථිකාචාර්ය,
තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

පී. ඩී. ඩී. ලක්මාල් මයා, සහකාර කථිකාචාර්ය,
සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

**බාහිර** : බි. ජේ. පුෂ්පකුමාර මයා, ගුරු සේවය,
ර/කහවත්ත මධ්‍ය මහා විද්‍යාලය, කහවත්ත.

එම්. බී. මංජුල ප්‍රභාත් ජයරත්න මයා, ගුරු සේවය,
තොරතුරු තාක්ෂණ හා දූරස්ථ අධ්‍යාපන,
කේන්ද්‍රස්ථානය, ර/ආනන්ද මෛත්‍රිය ජාතික
පාසල, බලංගොඩ.

චමෝද් තනුර අමරසිරි මයා, ගුරු සේවය
තොරතුරු තාක්ෂණ හා දූරස්ථ අධ්‍යාපන,
කේන්ද්‍රස්ථානය, කොළොන්න,
ඇඹිලිපිටිය.

ආචාර්ය අරෝෂා මැදිවක, ගුරු සේවය
තොරතුරු තාක්ෂණ හා දූරස්ථ අධ්‍යාපන,
කේන්ද්‍රස්ථානය, කොළඹ 05.

එම්. බී. මංජුල ප්‍රභාත් ජයරත්න මයා, ගුරු සේවය,
තොරතුරු තාක්ෂණ හා දූරස්ථ අධ්‍යාපන,
කේන්ද්‍රස්ථානය, ර/ආනන්ද මෛත්‍රිය ජාතික
පාසල, බලංගොඩ.

සංස්කරණය :

මහාචාර්ය එස්. ආර්. කොඩිතුවක්කු
පරිගණක විද්‍යාව පිළිබඳ මහාචාර්ය
සංඛ්‍යාන හා පරිගණක විද්‍යා දෙපාර්තමේන්තුව
විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ආචාර්ය ගාමිණී විජේරත්න
පීඨාධිපති
පරිගණන හා තාක්ෂණ පීඨය
කාළණිය විශ්වවිද්‍යාලය

එස්. එන්. මාදුවගේ මයා
අධ්‍යක්ෂ(විශ්‍රාමික)
තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

පී. එස්. සදමාලි මිය, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන
අමාත්‍යාංශය

භාෂා සංස්කරණය :

ඊ. ආර්. නිමල් ප්‍රේමකුමාර
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (විශ්‍රාමික)
ජාතික අධ්‍යාපන ආයතනය

පිටු සැකසුම :

එම්. බී. මංජුල ප්‍රභාත් ජයරත්න මයා
ගුරු සේවය

# හැඳින්වීම

වර්තමාන වේගවත්, තාක්ෂණය මත පදනම් වූ පරිසරය තුළ, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික කුසලතා අවශ්‍යතාව ඉතාමත් දැඩි වී ඇත. මෙම වැඩිදුර අධ්‍යයන මොඩියුල 6 ශ්‍රේණිය අවසන් වන විට සිසුන්ගේ හැකියාවන් සහ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා නිර්මාණය කර ඇති අතර, වේගයෙන් පරිණාමය වන ලෝකයක ඉල්ලීම් සඳහා ඔවුන් සූදානම් කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. මෙම මොඩියුලය විවිධ ඉගෙනුම් වේගයන් සහ කාලසටහන්වලට අනුගත වන ස්වයං අධ්‍යනය කරන ලද ඉගෙනුම් ක්‍රියාකාරකම් සමඟින් සිසුන්ගේ අවබෝධය සහතික කිරීම සඳහා නිර්මාණය කර ඇති අතර ඊට ගැළපෙන අභ්‍යාස සහ මාර්ගෝපදේශ ඇතුළත් වේ. ඔවුන්ගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සම වයසේ මිතුරන් සමඟ වැඩ කිරීමට සිසුන් දිරිමත් කරමින් සහයෝගී ඉගෙනීම අවධාරණය කෙරේ. මෙම මොඩියුලය තොරතුරු තාක්ෂණය විෂයෙහි සුවිශේෂී විෂය කොටස් ඉගෙනීමට සහ තම දැනුම තවදුරටත් පුළුල් කිරීමට උනන්දුවක් දක්වන සිසුන්ට හැදෑරීම සඳහා නිර්මාණය කර ඇත. මෙම මොඩියුලයේ අවසාන පරමාර්ථය වන්නේ 21 වන සියවසේ සාර්ථකත්වය සඳහා අවශ්‍ය කුසලතාවලින් සිසුන් සන්නද්ධ කිරීම සහ ඔවුන්ගේ පෞද්ගලික ඉගෙනුම් අවශ්‍යතා හොඳින් සලකා බලා ඔවුන්ගේ පරිපූර්ණ සංවර්ධනයට සහාය වීමයි. මීට අමතරව, මෙම මොඩියුලයේ ඇතුළත් ක්‍රියාකාරකම් සහ අභ්‍යාස සම්පූර්ණ කිරීමට පහසුකම් සැලසීමට සහ දැනුම තවදුරටත් වැඩි දියුණු කිරීමට විවිධ වෙබ් අඩවි සහ යූටියුබ් (Youtube) සබැඳ සපයා ඇත. අදාළ අන්තර්ගත හිමිකරුවන්ට හෘදයාංගම ස්තූතිය පුද කරමි.

එස්. ශන්මුගලින්ගම් මයා, අධ්‍යක්ෂ,
තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව

වැඩිදුර අධ්‍යයන මොඩියුලය

සජීවිකරණ හා වීඩියෝ සංස්කරණ ආදි බහුමාධ්‍ය සංස්කරණ ක්‍රියාවලියේ දී ශ්‍රව්‍ය ගොනු හැසිරවීම අත්‍යවශ්‍ය කාර්යයකි. ශ්‍රව්‍ය ගොනුවක්, ශ්‍රව්‍ය සංස්කරණයට පෙර ශබ්ද ගොනුවල ඇතුළත් ශබ්දවල විවිධ වෙනස්කම් හොඳින් හඳුනා ගත යුතු ය. එම නිසා ශබ්ද හඳුනා ගැනීමේ සිට ශ්‍රව්‍ය ගොනුවක් පටිගත කිරීම හා ඒවා විවිධ ගුණාත්මක විලාසයන් එක් කරමින් සංස්කරණය කිරීම දක්වා මෙහි කරුණු දක්වා ඇත.

**මොඩියුලය භාවිතයට උපදෙස්**

- මෙම මොඩියුලය ඒකල හා කණ්ඩායම් ක්‍රියාකාරකම් මගින් ඔබගේ ශ්‍රව්‍ය ගොනු හැසිරීම පිළිබඳ මූලික දැනුම සහ එදිනෙදා අවශ්‍යතාවයන් සඳහා ශ්‍රව්‍ය මෘදුකාංග ප්‍රායෝගිකව භාවිත කිරීමේ කුසලතා සංවර්ධනය කර ගත හැකි වන අන්දමින් නිර්මාණය කර ඇත.

- ඔබගේ හැකියාවන් සහ දැනුම ඔප්නංවාලීමේ අරමුණින් අන්තර්ජාලය භාවිතයෙන් කරුණු සොයා සිදු කළ යුතු ක්‍රියාකාරකම් හා පැවරුම් ද මෙහි ඇතුළත් කර ඇත.

- මොඩියුල ක්‍රියාත්මක කිරීමේ දී ඔබගේ ගුරුභවතාගේ සහාය ඔබට ලැබෙන නමුදු එය නිසි පරිදි හැදෑරීම ඔබගේ කාර්යයකි.

- දිනපතා පන්ති මට්ටමේ සිදු වන ඇගයීම් හරහා අවසානයේ ඔබව ජාතික මට්ටමින් ද ඇගයීමට ලක් කෙරෙන බැවින් එම ක්‍රියාකාරකම් සහ පැවරුම් නිසි පරිදි නිම කිරීම ඉතාමත් වැදගත් වනු ඇත.

- මෙම ක්‍රියාකාරකම් හා පැවරුම් නිම කිරීමේ දී ඔබ සහ ඔබගේ යහළුවන් ඇගයීමේ අවස්ථා ද ඔබ වෙත ලැබී ඇත. එහි දී ඔබගේ අවංකභාවය සහ නිවැරදි තක්සේරුකරණය ඉතා වැදගත් වේ.

- ඒකකයක් අවසානයේ දී ඔබ ලබා ගත් කුසලතා මට්ටම ගුරුවරයා විසින් ඇගයීමකට ලක් කරනු ලබයි.

# පටුන


| මාතෘකාව | පිටු අංකය |
|---|---|
| ශ්‍රව්‍ය ගොනු සමග වැඩ කරමු | 1 |
| හඬට සවන් දෙමු. හඬට සංවේදී වෙමු | 3 |
| ශ්‍රව්‍ය උපාංග හඳුනා ගනිමු | 5 |
| හඬ පටිගත කරමු | 9 |
| ශ්‍රව්‍ය සංස්කරණය කරමු | 16 |
| පරිගණක තාක්ෂණයට අදාළ මූලික සංකල්ප | 33 |

# ඉගෙනුම් පල

මෙම මොඩියුලය අවසානයේ දී ඔබට,

- ශ්‍රව්‍ය පටිගත කිරීම සඳහා අවශ්‍ය විවිධ තාක්ෂණික උපකරණ භාවිතයට ගැනීම
- පටිගත කිරීම සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කර ගැනීම
- පටිගත කරන ස්ථානයක සදාචාරාත්මක හැසිරීම් පුරුදු කර ගැනීම
- මෘදුකාංග භාවිතයෙන් ශ්‍රව්‍ය පසුරක් පටිගත කිරීම
- අවශ්‍ය පරිදි පටිගත කළ ශ්‍රව්‍ය පසුරක් සංස්කරණය කිරීම
- ආයාත කරන (Import) ලද ශ්‍රව්‍ය පසුර අවශ්‍ය පරිදි සංස්කරණය කිරීම
- විවිධ ශ්‍රව්‍ය ගොනු ආකෘති වෙත පටිගත කරන ලද ශ්‍රව්‍ය පසුරු නිර්යාත කිරීම (Export)
- ශ්‍රව්‍ය පථයක් සැරිසැරීමට කෙටිමං යතුරු (Shortcut Key) භාවිත කිරීම
- ශ්‍රව්‍ය ගොනුවකට අමතර ශ්‍රව්‍ය කොටස් එක් කිරීම
- ශ්‍රව්‍ය සංස්කරණ මෘදුකාංගයකට බහු ශ්‍රව්‍ය ගොනු ආයාත කිරීම
- විවිධ ශ්‍රව්‍ය ගොනු ආකෘති භාවිත කිරීම
- ශ්‍රව්‍ය, ශ්‍රව්‍ය පටිගත කිරීම, ශ්‍රව්‍ය පසුර, ශ්‍රව්‍ය ගොනු ආකෘතිය, ශ්‍රව්‍ය පථය, සදාචාරාත්මක හැසිරීම් වැනි මූලික සංකල්ප තේරුම් ගැනීම
- විවිධ සන්දර්භ තුළ විවිධ පාරිසරික ශබ්දවල ලක්ෂණ සහ වැදගත්කම විශ්ලේෂණය කිරීම
- එදිනෙදා ජීවිතයේ විවිධ අංශ කෙරෙහි පරිගණක පාදක විනෝදාස්වාදයේ බලපෑම තක්සේරු කිරීම පිළිබඳ හැකියාව ලබා ගත හැකි ය.

# ශ්‍රව්‍ය ගොනු සමග වැඩ කරමු

මේ රට මගෙ රට - මා ඉපදුණ රට
හැදෙන වැඩෙන රට - මගේ ම මවු රට

ගායනය - මාලනී බුලත් සිංහල මහත්මිය

දුවේ, පුතේ,

ඔයාලා, මේ සිංදුව අහලා තියෙනවා නේ ද? ඔයාලා දන්නවා ද තාක්ෂණය යොදා ගෙන පටිගත කිරීමක් කළ නිසා තමයි මේ සින්දුව අපිට අහන්න පුළුවන් වෙලා තියෙන්නේ.

මේ සිංදුව සුරැකි ව තිබෙන නිසා අද වගේ ම ඉදිරි කාලවලදී ත් නැවත නැවත අහන්න පුළුවන්.

ඔබට ගීතය ඇසීමට අවශ්‍ය නම් පහත මේ සබැඳිය **(Link)** හෝ QR කේතය භාවිත කරන්න.

**Scan This**

https://tinyurl.com/meratasong

**Type This**

මෙම වෙබ් අඩවිවලට අවසන් වරට ප්‍රවේශ වූ දිනය : 2025-06-09

ඔයාලා දන්නවා ද, අපිට පුළුවන් මේ සින්දුව පටිගත කළා වගේ ම අපේ කටහඬත් පටිගත කර ගන්න. ඒ විතරක් නෙමෙයි දුවේ, පුතේ, පරිසරයට සවන්දීලා ලස්සන කුරුලු ගීත පටිගත කරන්නත් පුළුවන්. මේවා පටිගත කරනවා විතරක් නෙවෙයි, අපිට පුළුවන් පරිගණකය යොදා ගෙන මෘදුකාංගයක් භාවිතයෙන් අනවශ්‍ය කොටස් ඉවත් කරන්න. එහෙම නැති නම් අවශ්‍ය හඬ කොටස් වෙන ම පටිගත කරලා අපේ හඬ පටයේ ගුණාත්මක බව වැඩි කර ගන්න. ඒ අනුව ගීත පටිගත කිරීම ඉතා සංකීර්ණ ක්‍රියාවලියක් බව හිතා ගන්න පුළුවන් නේ ද?

දුවේ, පුතේ, අපි මේ මොඩියුලයෙන් ඉගෙන ගනිමු. අපේ පරිගණකයෙන් අපිට ම හඬ පටිගත කිරීමක් කරලා, අවශ්‍ය වෙනස්කම් කර ගන්න ආකාරය.

**ඔබ දන්නවා ද?**

- QR (Quick Response) කේත QR scanner යෙදුමක් මගින් විකේතනය (Decode) කර ගත හැකි ය. එවිට එහි අඩංගු දත්තවලට ප්‍රවේශ විය හැකි ය. මෙහි දී අන්තර්ජාලයේ ඇති ඕනෑ ම විඩියෝවක වෙබ් ලිපිනය QR කේතයක් බවට පත් කර ඇත. එය පරිලෝකනය (Scan) කිරීම මගින් ඔබේ සුහුරු ජංගම දූරකථනයට අන්තර්ජාල ප්‍රවේශය ඇති නම් එම දත්තවලට ප්‍රවේශ විය හැකි ය.
- ඊට පහළින් දක්වා ඇති වෙබ් ලිපිනය YouTube හි සෙවුම් කොටුවේ යතුරු ලියනය (type) කර එම දත්තවලට ප්‍රවේශ විය හැකි ය.
- මෙම මෙඩියුලය තුළ QR හෝ YouTube link ඇති නම් ඒවාට ප්‍රවේශ වීම සඳහා ඉහත ක්‍රමවේදය අනුගමනය කරන්න.

ශබ්දාගාරයක ගීතයක් පටිගත වන ආකාරය බලමු

https://tinyurl.com/audiostudiovideo

මෙම වෙබ් අඩවිවලට අවසන් වරට ප්‍රවේශ වූ දිනය : 2025-06-09

# 1

# හඬට සවන් දෙමු. හඬට සංවේදී වෙමු

**කාර්යය සාධන ප්‍රමිති**

- පරිසරයේ විවිධ ශබ්ද වෙන් කර හඳුනා ගනියි.

'හඬ' යනු සන්නිවේදන මාධ්‍යයක් වන අතර අප පරිසරයේ ජීවත් වන සියල්ලෝ ම හඬට සංවේදී වෙති.
වැස්සත් එක්ක එන හඬට ඔයාලා සවන් දීලා තියෙනවා නේ ද?
අර හෝ හෝ හඬ......?
ඒත් දුවේ, පුතේ,

- මී මැස්සන්ගේ ගුම් ගුම් නාදයට,
- කුරුල්ලන්ගේ අත්තටු ගසන හඬට,
- මුහුදේ රළ හඬට,
- සුළඟට ගස් සෙලවෙන හඬට,
- කුරුල්ලන්ගේ කිචි බිචියට



ඔබ කවදා හෝ සංවේදී ව සවන් දී තිබේ ද?
එසේ ම මල් පෙත්තක් පිපෙන හඬකට සවන්දීමට ඔබ කවදාක හෝ සිතුවා ද? දැන් ඔබ පරිසරයේ ඇසෙන වෙනත් මෙවැනි ශබ්දයන්ට සංවේදී වීමට පුරුදු වන්න.

IMPORTANT

"Music is Organized Sound"
(Edgard Varese)
"සංගීතය සංවිධිත ව සකස් කරන ලද ශබ්දයකි"
(එඩ්ගාඩ් වරේස්)

### ක්‍රියාකාරකම 1.1

එදිනෙදා ජීවිතයේ දී ඔබට හා ඔබගේ මිතුරන්ට ඇසී ඇති ඕනෑ ම ශබ්ද/හඬ මිතුරන් සමග සාකච්ඡා කොට ලැයිස්තු ගත කර පන්තියට ඉදිරිපත් කරන්න.

(මිනිත්තු 25යි)

### ඔබ දන්නවා ද?

**පළමු වරට පටිගත කරන ලද ශබ්දය කුමක් ද?**

ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම් බෙල්ගේ පළමු දුරකථන ඇමතුමට (1876) දශක දෙකකට පමණ පෙර එනම් 1850 ගණන්වල අගභාගයේ දී එය Edouard-Leon Scott de Martinville (එඩෝඅර්ඩ් ලියෝන් ස්කොට් ඩි මාටින්වයිල්) විසින් පැරිසියේ දී මෙය පටිගත කරන ලදි.

මේ පිළිබඳ වැඩිදුර විස්තර සඳහා පහත QR කේතය Scan කරන්න.



https://tinyurl.com/oldsoundrecord

මෙම වෙබ් අඩවිවලට අවසන් වරට ප්‍රවේශ වූ දිනය : 2025-06-09

2

# ශ්‍රව්‍ය උපාංග හඳුනා ගනිමු

**කාර්යය සාධන ප්‍රමිති**

- අංකිත පටිගත කිරීමේ උපාංග හඳුනා ගනියි.

දුවේ, පුතේ, ඔයාලා දන්නවා ද, ශබ්දයක් ස්වාභාවික ව හෝ කෘත්‍රිම ව නිර්මාණය කළාට, එම ශබ්ද ඩිජිටල් උපාංගයකට ඇතුළත් කිරීමට හා ඩිජිටල් උපාංග භාවිතයෙන් සවන් දීමට අපිට විවිධ තාක්ෂණික මෙවලම් අවශ්‍ය බව.

**ඔබ දන්නවා ද?**

**තරංග ආකෘතිය (waveform)**

මෘදුකාංගයකට ශ්‍රව්‍ය ගොනුවක් ඇතුළු කළ විට එය රූපමය වශයෙන් පෙන්වන්නේ පහත ආකාරයෙනි. එය අපි waveform හෙවත් තරංග ආකෘතිය ලෙස හඳුන්වමු. මෙහි විද්‍යාත්මක පසුබිම ඔබට ඉදිරි ශ්‍රේණිවල දී විද්‍යා විෂය මගින් ඉගෙන ගත හැකි ය.



**පෙර සූදානම**

වැඩිහිටියෙකුගේ ද ආධාරය ඇතුව රූපවාහිනී යන්ත්‍රයක ඇති ශබ්ද කෙවෙනිවල (audio ports) වර්ණ වෙනස්කම් නිරීක්ෂණය කරන්න.

### ක්‍රියාකාරකම 2.1

- ගුරු උපදෙස් අනුව කණ්ඩායම් වන්න.
- ඔබට ලබා දෙන ශ්‍රව්‍ය උපාංග පිළිබඳ ව කණ්ඩායම සමග සාකච්ඡා කර හඳුනා ගන්න.
- ගුරුතුමා හෝ ගුරුතුමියගේ සහය ඇතිව එම උපාංග පරිගණකයට නිවැරදි ව සම්බන්ධ කරන්න.
- එම උපාංගවල කාර්යයන් පිළිබඳ සාකච්ඡා කරන්න.

(මිනිත්තු 25යි)

### අභ්‍යාසය 2.1.1

පහත දක්වා ඇති තාක්ෂණික උපාංග හඳුනා ගනිමින් ඒ ඒ උපාංගයෙන් සිදු වන කාර්යය දක්වන්න.



උපාංගවල නම

..............................................................

..............................................................

කාර්යය

..............................................................

..............................................................



උපාංගවල නම

...........................................................

...........................................................

කාර්යය

...........................................................

...........................................................



උපාංගවල නම

...........................................................

...........................................................

කාර්යය

...........................................................

...........................................................

අභ්‍යාසය 2.1.2

පහත එක් එක් ශබ්ද කෙවෙනියේ වර්ණය හඳුනාගෙන ඒවාට සම්බන්ධ කළ යුත්තේ කුමන උපාංගය දැයි පහත පද ලැයිස්තුවෙන් තෝරා ලියන්න.



........................ ........................ ........................

(ස්පීකරය/ශබ්ද ප්‍රතිදානය, මයික්‍රෝෆෝනය, ශබ්ද ආදානය)

| ස්වයං තක්සේරුකරණය | | |
|---|---|---|
| තක්සේරුකරණ නිර්ණායකය<br>■ ශබ්ද උපාංග නිවැරදිව සම්බන්ධ කිරීම | | |
| ඔබට ඉටු කළ හැකි කාර්යයන් ඉදිරියේ ඇති කොටුවේ "✓"සලකුණ යොදන්න. | | |
| විෂය කාර්ය | කාර්යයන් | "✓"සලකුණ |
| | 1. ශබ්ද උපාංග මොනවාදැයි තෝරා ගැනීමට මට පුළුවනි. | |
| | 2. කෙවෙනියෙහි වර්ණය අනුව කෙවෙනිය කුමක්දැයි තෝරා ගැනීමට මට පුළුවනි. | |
| | 3. කෙවිනියෙහි වර්ණය අනුව සම්බන්ධ කළ යුතු උපාංගය කුමක්දැයි තෝරා ගැනීමට මට පුළුවනි. | |
| | 4. ශබ්ද උපාංග නම් කිරීමට මට පුළුවනි. | |
| | 5. ශබ්ද උපාංග පරිගණකයේ නිවැරදි කෙවෙනියට සවි කිරීමට මට පුළුවනි. | |
| "✓"සලකුණු ගණන | | |
| ඔබට හිමි ලකුණු ගණන | | ......... /5 |

| | |
|---|---|
| "✓" ලකුණු ගණන 5 නම් | ඉතා හොඳයි (ලකුණු 5යි) |
| "✓" ලකුණු ගණන 4 නම් | හොඳයි (ලකුණු 4යි) |
| "✓" ලකුණු ගණන 3 නම් | අපේක්ෂිත ඉලක්කයට ආසන්නයි (ලකුණු 3යි) |
| "✓" ලකුණු ගණන 2 නම් | සංවර්ධනය විය යුතුයි |

# 3

# හඬ පටිගත කරමු

**කාර්යය සාධන ප්‍රමිති**

- ශබ්ද සංස්කරණ මෘදුකාංගයක් භාවිතයෙන් හඬපටයක් පටිගත කරයි.

අපට නැවත නැවත ශබ්ද ඇසීමට නම් එම ශබ්ද පටිගත කළ (Record) යුතු ය. අතීතයේ දී ශබ්ද පටිගත කිරීමට,

- කැසට් පට (Cassette Tapes)
- ග්‍රැමර්ෆෝන් තැටි (Gramophone Disk) භාවිත කරන ලදි.




3.1 කැසට් පට



3.2 ග්‍රැමර්ෆෝන්

වර්තමානයේ දී ඉතා ඉහළ ගුණාත්මක භාවයකින් යුතු ඩිජිටල් පටිගත කිරීම් සිදු කරන අතර, ඒ සඳහා පටිගත කිරීමේ උපාංගවලට අමතර ව මෘදුකාංගයක සහය ද අත්‍යවශ්‍ය වේ.

ශබ්ද පටිගත කිරීමට අවශ්‍ය උපාංග

- මයික්‍රෆෝනය (Microphones)
- නාදක (Speakers)
- ඉස්බනුව (Headset/ Headphone)

## පෙර සූදානම

පහත සඳහන් 3.1 ක්‍රියාකාරකමට අදාළ පටිගත කිරීම සඳහා අවශ්‍ය
- උදෑසන සිතුවිල්ලක්
- පාසල් ගීතයේ පද පෙළ
- පණිවිඩයක් හෝ ගීතයක්
- නිවේදනයක්

ලියා ගෙන පැමිණෙන්න.



ක්‍රියාකාරකම 3.1

පහත සඳහන් මාතෘකා අතරින් ඔබ කණ්ඩායමට ලැබී ඇති මාතෘකාවට අදාළ පටිගත කිරීම Voice Recorder/ Sound Recorder භාවිතයෙන් සිදු කර පන්තියට ඉදිරිපත් කරන්න.

- උදෑසන දවසේ සිතුවිල්ල
- උදෑසන රැස්වීමේ දී වාදනය කිරීම සඳහා පාසල් ගීතය
- විවේක කාලයේ දී මුළු පාසලට ම ශ්‍රවණය කළ හැකි පණිවිඩයක් හෝ ගීතයක්
- පාසලේ නිවේදනයක්

(මිනිත්තු 50යි)

## ක්‍රියාකාරකම 3.2

- ක්‍රියාකාරකම 3.1හි ඔබ කණ්ඩායම විසින් පටිගත කරන ලද ශ්‍රව්‍ය ගොනුවට නැවත සවන් දෙන්න.
- ඒ අනුව එහි දෝෂ ඇති නම් ඒවා හඳුනා ගෙන ශබ්ද පටිගත කිරීමට පරිසරය කුමන ආකාරයෙන් සකස් විය යුතු දැයි සාකච්ඡා කර ලැයිස්තු ගත කරන්න.
- ශබ්ද පටිගත කරන ස්ථානයක් තුළ පිළිපැදිය යුතු ආචාර ධර්ම ලැයිස්තු ගත කරන්න.
- ඔබ කණ්ඩායම සොයා ගත් කරුණු පන්තියට ඉදිරිපත් කරන්න.

(මිනිත්තු 50යි)

### ඔබ දන්නවා ද?

ඇන්ඩ්‍රොයිඩ් මෙහෙයුම් පද්ධතියේ ශබ්ද පටිගත කිරීමේ යෙදුම් (Voice Recorder apps) කිහිපයක් පහත දැක්වේ.

- Dolby on
- ASR Voice Recorder
- GOM Recorder
- Voice Recorder

## ඔබගේ දැනුමට

### ශබ්ද පටිගත කිරීමේ දී යොදා ගන්නා මෘදුකාංගයක් හඳුනා ගනිමු.

Voice Recorder/ Sound Recorder භාවිත කර ශබ්දය පටිගත කිරීම.

- ඔබගේ පරිගණකයෙහි සෙවුම් කවුළුවෙහි Voice Recorder/ Sound Recorder ලෙස යතුරු ලියනය (Type) කිරීමෙන් Voice Recorder/ Sound Recorder වෙත ප්‍රවේශ විය හැකි ය.






- Voice Recorder වෙත ප්‍රවේශ වූ පසු ලැබෙන අතුරු මුහුණතෙහි (Interface) දර්ශනය වන මෙම අයිකනය (Icon) මත ක්ලික් (Click) කිරීමෙන් ශබ්දය (Sound) පටිගත කිරීම (Record) ආරම්භ කළ හැකි ය.





- පටිගත කිරීම තාවකාලිකව නතර කිරීම (Pause) සඳහා Pause බොත්තම භාවිත කළ හැකි ය.




- පටිගත කිරීම අතරතුර, Pause කිරීමෙන් පසු නැවත පටිගත කිරීම ආරම්භ කිරීම සඳහා Resume recording භාවිත කළ හැකි ය.




- පටිගත කිරීම අවසන් කිරීම සඳහා Stop recording භාවිත කළ හැකි ය.



- ශබ්ද ගොනුව ගබඩා වී ඇති ස්ථානය සොයා ගැනීම පටිගත වූ ශබ්ද ගොනුවේ නම මත මූසිකයේ දකුණු බොත්තම ක්ලික් කිරීමෙන් ලැබෙන ලැයිස්තුවෙන් Open File Location යන්න තෝරා ගත හැකි




දෙබස් පටිගත කිරීමේ දී නොයෙක් හැඟීමෙන්, නොයෙක් ස්වරූපවලින් එම දෙබස පටිගත කිරීමට උත්සාහ කළ හැකි ය. එවිට විවිධ අර්ථ එම දෙබසට ලැබේ.



උදා:- "මට බඩගිනියි." යන වාක්‍යය ආවේගශීලී ව, බැගෑපත් ව සහ සාමාන්‍ය ලෙස උච්චාරණය කිරීම.

පටිගත කිරීමක් සඳහා සුදුසු පරිදි පරිසරය සකස් කිරීම ඉතාමත් වැදගත් වන අතර වාණිජ මට්ටමෙන්, ශබ්ද පටිගත කිරීමට, ඒවාට ම සැකසූ ශබ්දාගාර අප විසින් භාවිත කරනු ලැබේ. ඒවායෙහි බාහිර ශබ්ද ඇතුළට නොඇසෙන ලෙසත්, ශබ්දාගාරය තුළ ඇති ශබ්ද පිටතට කාන්දු නොවන ලෙසත් නිර්මාණය කර ඇත. මේ ශබ්දාගාර සඳහා විවිධාකාරයේ තාක්ෂණික ක්‍රමවේද භාවිත කරමින් ශබ්දාරක්ෂිත (soundproof) කර නිර්මාණය කර ඇත. එලෙස නිර්මාණය කර ඇති ශබ්දාගාර තුළ අධිතාක්ෂණික මයික්‍රොෆෝන, විවිධාකාරයේ ශබ්ද පටිගත කිරීමේ යන්ත්‍ර ස්ථාපිත කර ඇති අතර ම, මෙම ශබ්දාගාර භාවිතයේ දී දැඩි ලෙස පිළිපැදිය යුතු ආචාර ධර්ම පද්ධතියක් ද ඇත.

## ක්‍රියාකාරකම 3.3

- ඉහත 3.2 ක්‍රියාකාරකමෙහි දී හඳුනා ගත් දෝෂ අවම වන පරිදි පරිසරය සකසා ගන්න.
- ක්‍රියාකාරකම 3.1හි ඔබ කණ්ඩායම විසින් පටිගත කරන ලද ශ්‍රව්‍ය ගොනුව නැවත පටිගත කර පන්තියට ඉදිරිපත් කරන්න.

(මිනිත්තු 50යි)

### ඔබ දන්නවා ද?

NASA ආයතනය විසින් සූර්යයාගේ ශබ්දය පටිගත කර මිනිස් ශ්‍රවණ පරාසයන්ට අනුව සකසා ඇත. එම සුවිශේෂ ශ්‍රව්‍ය ඛණ්ඩයට සවන් දීමට පහත QR කේතය හෝ YouTube සබැඳිය භාවිත කළ හැකි ය.

https://youtu.be/CRu_hG3X3bI?si=Ld-x_yesFhSvanY5

මෙම වෙබ් අඩවිවලට අවසන් වරට ප්‍රවේශ වූ දිනය : 2025-06-09

සිනමා කර්මාන්තයේ දී භාවිත කරන"ශොට්ගන් මයික්" (shotgun mike)



<table>
<tr><th colspan="3">ස්වයං තක්සේරුකරණය</th></tr>
<tr><td colspan="3">තක්සේරුකරණ නිර්ණායකය<br>■ ශබ්ද සංස්කරණ මෘදුකාංග භාවිතයෙන් හඬ පටිගත කිරීම</td></tr>
<tr><td colspan="3">ඔබට ඉටු කළ හැකි කාර්යයන් ඉදිරියේ ඇති කොටුවේ "✓" සලකුණ යොදන්න.</td></tr>
<tr><td rowspan="6">විෂය ක්ෂේත්‍ර</td><td>කාර්යයන්</td><td>"✓" සලකුණ</td></tr>
<tr><td>1. හඬ පටිගත කිරීමට සුදුසු උපාංග තෝරා ගැනීමට මට පුළුවනි.</td><td></td></tr>
<tr><td>2. හඬ පටිගත කිරීමට සුදුසු උපාංගයක් පරිගණකයට සම්බන්ධ කිරීමට මට පුළුවනි.</td><td></td></tr>
<tr><td>3. පරිගණකය භාවිතයෙන් හඬ පටිගත කිරීමට සහ ඇති වන දෝෂ නිරාකරණය කිරීමට මට පුළුවනි.</td><td></td></tr>
<tr><td>4. හඬ පටිගත කිරීමට සුදුසු පරිසරයක් සකසා ගැනීමට මට පුළුවනි.</td><td></td></tr>
<tr><td>5. හඬ පටිගත කිරීමට සුදුසු මෘදුකාංගයක් තෝරා ගැනීමට මට පුළුවනි.</td><td></td></tr>
<tr><td colspan="2">"✓"සලකුණු ගණන</td><td></td></tr>
<tr><td colspan="2">ඔබට හිමි ලකුණු ගණන</td><td>......... /5</td></tr>
</table>

| | |
|---|---|
| "✓" ලකුණු ගණන 5 නම් | ඉතා හොඳයි (ලකුණු 5යි) |
| "✓" ලකුණු ගණන 4 නම් | හොඳයි (ලකුණු 4යි) |
| "✓" ලකුණු ගණන 3 නම් | අපේක්ෂිත ඉලක්කයට ආසන්නයි (ලකුණු 3යි) |
| "✓" ලකුණු ගණන 2 නම් | සංවර්ධනය විය යුතුය |

4

# හඬ සංස්කරණය කරමු

**කාර්යය සාධන ප්‍රමිති**

- ශ්‍රව්‍ය සංස්කරණ මෘදුකාංග භාවිතයෙන් ආනයනය (Import) කරන ලද ශබ්ද පසුරක් (Clip) සංස්කරණය කරයි.

ශබ්ද හෝ හඬ පටිගත කිරීමෙන් ශ්‍රව්‍ය ගොනු නිර්මාණය කරයි. මෙම ශ්‍රව්‍ය ගොනු, පරිගණකය භාවිත කර නිර්මාණය කිරීමටත් සංස්කරණය කිරීමටත්, භාවිත කරන මෘදුකාංග, ශ්‍රව්‍ය සංස්කරණ මෘදුකාංග නම් වේ.

**ශ්‍රව්‍ය සංස්කරණ මෘදුකාංග** (Audio Editing Software)

පටිගත කිරීමට සහ සංස්කරණය කිරීම සඳහා නොමිලයේ භාවිත කළ හැකි මෘදුකාංගවලට උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

- Audacity
- Power Sound Editor
- Music Editor Free

මීට අමතර ව Adobe audition වැනි වාණිජ වශයෙන් භාවිතයට ගත හැකි මෘදුකාංග ද ඇත.

**ඔබ දන්නවා ද?**

**නිවැරදි පටිගත කිරීමක් සඳහා අත් පිටපතක් සකස් කර ගැනීම**

පටිගත කිරීමට අපේක්ෂා කරන පණිවිඩය හෝ කරුණු ඔබට කොතරම් හුරු පුරුදු දෙයක් වුව ද එය පැහැදිලි ව පෙනෙන පරිදි කොළයක ලියා ගත යුතු ය. එනම් පටිගත කිරීමට බලාපොරොත්තු වන පණිවිඩයේ හෝ කරුණු ඇතුළත් අත් පිටපතක් ඔබ සතු ව තිබිය යුතු ය.

## ක්‍රියාකාරකම 4.1

- පන්තිය කණ්ඩායම් දෙකකට බෙදෙන්න.
- පළමු කණ්ඩායමට ලැබුණ කවි පෙළ ගායනය කරන්න.
- දෙවන කණ්ඩායමේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් දෑස් වසාගෙන, එම ගායනයට හොඳින් සවන් දෙන්න.
- පළමු කණ්ඩායම ගායනය සිදු කරන අතරතුර එම කණ්ඩායමෙහි ම වෙනත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් වරින් වර සියුම් ශබ්ද කිහිපයක් ඇති කරන්න. (ගුරුවරයාගේ උපදෙස් පරිදි)
- ගායනයෙන් අනතුරු ව දෙවන කණ්ඩායම, පළමු කණ්ඩායම ගයන අතරතුර අනවශ්‍ය ශබ්ද ඇසුණු අවස්ථා ඉදිරිපත් කරන්න.
- මේ ආකාරයට දෙවන කණ්ඩායම ද ගායනය කරන අතරතුර පළමු කණ්ඩායම එම ගායනයට හොඳින් සවන් දී අනවශ්‍ය ශබ්ද ඇසුණු අවස්ථා ඉදිරිපත් කරන්න.

(මිනිත්තු 50යි)

### ඔබ දන්නවා ද?

ශ්‍රව්‍ය පසුරක් සංස්කරණය කිරීම සඳහා එහි පවතින අනවශ්‍ය ශබ්ද (ඝෝෂාව) හොඳින් හඳුනා ගැනීමට හැකි වන අයුරින් ඔබේ සවන් හුරු කර ගත යුතු අතර ඒ සඳහා අවධානය රඳවා තබා ගැනීමට වග බලා ගත යුතු ය. එය අනවශ්‍ය ශබ්ද පහසුවෙන් හඳුනා ගෙන ඉවත් කිරීමටත් ගුණාත්මක ශ්‍රව්‍ය පසුරක් නිර්මාණය කර ගැනීමටත් ඉවහල් වේ.

### පෙර සූදානම

- පාසලේ කාලච්ඡේද මාරුවීම නිවේදනය කිරීමට උචිත අත් පිටපතක් (Script) සකස් කර ගෙන පන්තියට පැමිණෙන්න. (ඔබේ මවුබසින් හා ඉංග්‍රීසි බසින්)

උදා "මේ ආරම්භ වන්නේ පළමු කාලච්ඡේදයයි"
"This is the beginning of the first period"

ක්‍රියාකාරකම 4.2

- කාලච්ඡේදය අවසන් වී ඊ ළඟ කාලච්ඡේදය ආරම්භ වූ බව හඟවන නිවේදනය භාෂා දෙකක ශ්‍රව්‍ය පථයක් ලෙස ශ්‍රව්‍ය සංස්කරණය කිරීමේ මෘදුකාංගයක් (Audio Editing Software) භාවිත කර පටිගත කරන්න.
- පටිගත කරන ලද ශ්‍රව්‍ය පථය (Audio Track) ධාවනය කර (Play) එයට සවන් දෙන්න.
- ඔබගේ පටිගත කිරීම පරිගණකයේ ගබඩා (Save) කරන්න.
- ඔබගේ පටිගත කිරීම පන්තියට ඉදිරිපත් කරන්න.

(මිනිත්තු 50යි)

අභ්‍යාසය 4.2.1

පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න

(1) ශ්‍රව්‍ය ගොනු සංස්කරණය කළ යුතු වන්නේ ඇයි?

(2) නිදහස් හා විවෘත කේතක (Free and Open Source Software) ශ්‍රව්‍ය සංස්කරණ මෘදුකාංග දෙකක් නම් කරන්න.

(3) ශ්‍රව්‍ය සංස්කරණය සඳහා ඇති වාණිජමය මෘදුකාංගයක් නම් කරන්න.

ඔබගේ දැනුමට

Audacity භාවිතයෙන් ශ්‍රව්‍ය පටිගත කිරීම

- Audacity මෘදුකාංගය විවෘත කරන්න
- නව Layers ගැනීම (හෝ File → New )
- File → Save Project → Save Project

Audacity මෘදුකාංගයෙන් ශබ්ද පටිගත කිරීමේ දී පරිවහන මෙවලම් තීරුව (Transport Toolbar) භාවිත කරයි. මෙමගින් ශබ්ද පටිගත කිරීම (Recording), නැවත ධාවනය කිරීම (Playback), පාලනය කිරීම සහ ව්‍යාපෘතියේ (ආරම්භයට හෝ අවසානයට) පසු පසට හෝ ඉදිරියට ගමන් කළ හැකි ය.

File → Save Project මගින් Audacity වලට පමණක් විවෘත කළ හැකි ලෙස Audacity ව්‍යාපෘති ආකෘතියෙන් ශ්‍රව්‍ය සුරැකීම සිදු වේ. .aup තිත් ප්‍රසාරකය සමග (dot extention) මෙම ආකෘතියට අනුව තැන්පත් කරනු ලබන ගොනු, සංස්කරණය සඳහා යොදා ගත හැකි ය.




- පටිගත කිරීම (Record)
  ශබ්දය පටිගත කිරීම ආරම්භ කිරීමට භාවිත කරයි.

- නැවැත්වීම (stop)
  ශබ්දය පටිගත කිරීම හෝ ධාවනය වන ශ්‍රව්‍ය පසුරුව නතර කිරීමට භාවිත කරයි.

- විරාමය (Pause)
  පටිගත කිරීම හෝ ධාවනය වන ශ්‍රව්‍ය පසුරුව තාවකාලික ව නතර කිරීමට භාවිත කරයි. දෙවන වරටත් විරාමය මත ක්ලික් කිරීම මගින් නැවත පටිගත කිරීම හෝ ශ්‍රව්‍ය පසුරුව ධාවනය කිරීම ආරම්භ කළ හැකි ය.

- **ධාවනය (Play)**
  පටිගත කරන ලද ශ්‍රව්‍ය පසුරුව ධාවනය කිරීමට භාවිත කරයි.

- **ආරම්භයට ගමන් කිරීම (Skip to Start)**
  ශ්‍රව්‍ය පසුරුවේ ආරම්භයට ගමන් කිරීමට භාවිත කරයි.

- **අවසානයට ගමන් කිරීම (Skip to Stop)**
  ශ්‍රව්‍ය පසුරුවේ අවසානයට ගමන් කිරීමට භාවිත කරයි.



ක්‍රියාකාරකම 4.3

කාලච්ඡේද මාරුවීමට භාෂා කිහිපයකින් ශ්‍රව්‍ය ඛණ්ඩයක් වාදනය වීම සඳහා වැඩි කාලයක් ගත වන බැවින් ප්‍රධාන මාධ්‍ය භාෂාවෙන් වාදනය වීමට සලස්වන ලෙස ඔබෙන් ඉල්ලා ඇතැයි සිතන්න. ශ්‍රව්‍ය සංස්කරණය කිරීමේ මෘදුකාංගයක් භාවිතයෙන් ශ්‍රව්‍ය පසුරුවක කොටසක් ඉවත් කර ගුණාත්මක ශ්‍රව්‍ය ගොනුවක් නිර්මාණය කරන්න.

- ක්‍රියාකාරකම 4.2හි දී නිර්මාණය කර ගත් ශ්‍රව්‍ය ගොනුව Audacity මෘදුකාංගය භාවිතයෙන් විවෘත කර ගන්න.
- එය ධාවනය කර (Play) හොඳින් සවන් දෙන්න.
- එහි අඩංගු භාෂා දෙකක නිවේදනය වෙනුවට ඔබේ පාසලේ ප්‍රධාන මාධ්‍ය භාෂාවෙන් දැක්වෙන නිවේදනය පමණක් ඉතිරි කර අනෙක් භාෂාවට අදාළ ශ්‍රව්‍ය කොටස ඉවත් කරන්න.
- සංස්කරණයෙන් පසු ඔබේ නව ශ්‍රව්‍ය පථය නැවත ධාවනය කර (Play) හොඳින් සවන් දෙන්න
- සංස්කරණය කර ගත් ශ්‍රව්‍ය පථය ගබඩා කිරීමට ස්ථානයක් තෝරා සුදුසු නමක් ලබා දී පරිගණකයේ ගබඩා කරන්න.

(මිනිත්තු 50යි)

**ඔබගේ දැනුමට**

**කෙටිමං යතුරු භාවිතයෙන් වැඩ පහසුකර ගනිමු.**

- යතුරු පුවරුවේ (Keyboard) ඇති Space යතුර, ශ්‍රව්‍ය පථය (Audio Track) ධාවනය (Play) හෝ නතර කිරීම (Stop) සඳහා කෙටිමං යතුරක් (Shortcut Key) ලෙස භාවිත කළ හැකි ය.

- ශ්‍රව්‍ය පථයේ කැමති ස්ථානයකින් ධාවනය ආරම්භ කිරීම සඳහා තේරීම් මෙවලම (Selection Tool) තෝරා ගෙන ශ්‍රව්‍ය පථයේ ධාවනය ආරම්භ කළ යුතු ස්ථානය මත ක්ලික් කර ධාවන බොත්තම (Play Button) මත ක්ලික් කළ හැකි ය.

- ශ්‍රව්‍ය පථය තුළ කර්සරය (cursor) වමට හෝ දකුණට ගෙන යාමට යතුරු පුවරුවේ වම් හෝ දකුණු දිශා යතුරු (Left or Right Arrow Keys) භාවිත කළ හැකි ය.

**ශ්‍රව්‍ය පථයේ කොටසක් තේරීම,**

- **මූසිකය භාවිතයෙන්**
  - අවශ්‍ය කොටස තේරීමට ආරම්භක ස්ථානය ක්ලික් කරන්න.
  - දිස්වන අත් ලකුණ ක්ලික් කර ගෙනම, තේරිය යුතු කොටසේ අවසානය තෙක් ඇද මූසිකය මුදා හරින්න.

- **යතුරු පුවරුව භාවිතයෙන්**
  - ශ්‍රව්‍ය පථයේ අවශ්‍ය කොටස තෝරා ගැනීමට දකුණු හෝ වම් දිශා යතුරු සමග Shift යතුර භාවිත කරන්න.

**සවන් දීමේ දී, ශ්‍රව්‍ය ගොනුවේ කොටස් මග හැරීම (Skip) සඳහා පහත සඳහන් යතුරු භාවිත කළ හැකි ය.**

- කර්සරය (cursor) තත්පරයක් පසුපසට ගෙන යාමට, වම් දිශා යතුර (Left Arrow Key) හෝ කොමා යතුර (,) යොදා ගත හැකි ය.

- කර්සරය තත්පරයක් ඉදිරියට ගෙන යාමට, දකුණු දිශා යතුර (Right Arrow Key) හෝ උඩු කොමා යතුර (’) යොදා ගත හැකි ය.

- කර්සරය තත්පර පහක් පසුපසට ගෙන යාමට, වම් දිශා යතුර (Left Arrow Key) සමග Shift යතුර හෝ කොමා යතුර (,) සමග Shift යතුර භාවිත කළ හැකි ය.

- කර්සරය තත්පර පහක් ඉදිරියට ගෙන යාමට, දකුණු දිශා යතුර (Right Arrow Key) සමග Shift යතුර හෝ තිත් යතුර(’) සමග Shift යතුර ඔබන්න (Press).

- සුරකින ලද ශ්‍රව්‍ය ගොනුවක් විවෘත කර ගැනීම සඳහා Audacity File → Open (Ctrl + O) මාර්ගය යොදා ගන්න.

**ශ්‍රව්‍ය පථයක (Audio track) කොටසක් ඉවත් කිරීම**

- පළමු ව තේරීම් මෙවලම (Selection Tool) තෝරා ගන්න.

- ඉන් පසුව ශ්‍රව්‍ය පථයේ ඉවත් කළ යුතු ස්ථානය මත ක්ලික් කරන්න.

- ඉන් පසු අවශ්‍ය විස්තරය දකින තුරු විශාලනය බොත්තම (Zoom in) ක්ලික් කරන්න.



- Shift යතුර ඔබා ගෙන සිටින අතරතුර ඉවත් කළ යුතු කොටසේ අවසාන ස්ථානයේ කර්සරය ක්ලික් කරන්න.
- Edit Tool bar හි ඇති Cut මෙවලම හෝ Delete යතුර ද භාවිත කළ හැකි ය.

## ක්‍රියාකාරකම 4.4

- ගුරු උපදෙස් අනුව කණ්ඩායම් වන්න.
- ගුරුතුමා හෝ ගුරුතුමිය විසින් ඔබ කණ්ඩායමට ලබා දුන් ගී පද යොදා ගෙන සංවිධානය වී කොටස් වශයෙන් ගීතය ගායනා කරන්න.
- ශ්‍රව්‍ය සංස්කරණ මෘදුකාංගය මගින් එය පටිගත කරන්න (Record).
- ගීතයේ එක ම කොටස නැවත නැවත යෙදෙන අවස්ථාවල දී එය එක් අවස්ථාවක් පමණක් ගායනා කර පටිගත කරන්න.
- එය ධාවනය (Play) කර හොඳින් සවන් දෙන්න.
- ගීතයේ එක ම කොටස නැවත නැවත යෙදිය යුතු ස්ථාන හොඳින් හඳුනා ගන්න. (තරංග ආකෘතියේ (Waveform) අදාළ ස්ථානය හොඳින් හඳුනා ගන්න.)
- ගීතයේ නැවත නැවත යෙදෙන කොටස පිටපත් කර (Copy) තරංග ආකෘතියේ (Waveform) අදාළ ස්ථානවල ස්ථානගත කරන්න. (Paste)
- එලෙස සකසා ගත් නව ශ්‍රව්‍ය පථය සුරකින්න (Save)
- නව ශ්‍රව්‍ය පථය නිර්යාත (Export) කරන්න.
- ඔබ කණ්ඩායම විසින් සකසා ගත් ශ්‍රව්‍ය ගොනුව පන්තියට ඉදිරිපත් කරන්න.

(මිනිත්තු 50යි)

### ඔබ දන්නවා ද?

**පිටපත් කිරීම(Copy) සහ ඇලවීම (Paste) භාවිතයෙන් ශ්‍රව්‍ය ගොනුවක අවශ්‍ය කොටස් ස්ථාන ගත කිරීම.**

- සංස්කරණ මෙවලම් තීරුව (Edit Toolbar) භාවිතයෙන් හෝ කෙටිමං යතුරු (Shortcut Keys) භාවිත කරමින් ගීතයේ අවශ්‍ය කොටස තෝරා පිටපත් කර (Copy/ Ctrl+C) ගත හැකි ය.
- තරංග ආකෘතියේ, අදාළ ගීත කොටස පිටපත් කිරීමට අවශ්‍ය ස්ථානය මත ක්ලික් කිරීම.
- සංස්කරණ මෙවලම් තීරුව (Edit Toolbar) භාවිතයෙන් හෝ කෙටිමං යතුරු (Shortcut Keys) භාවිත කරමින් ශ්‍රව්‍ය පටයේ අවශ්‍ය කොටස ඇලවිය හැකි ය. (Paste / Ctrl+V).
- ශ්‍රව්‍ය පටයේ කොටසක් නොගැළපෙන ස්ථානයක පවතී නම්, එම කොටස තෝරා (Select), කපා (Cut), අවශ්‍ය ස්ථානයට ඇලවිය (Paste) හැකි ය.
- ශ්‍රව්‍ය පටය කැපීමට Ctrl+X කෙටිමං යතුරු භාවිත කළ හැකි ය.

### ඔබ දන්නවා ද?

ගොනු දිගුවක් (File extention) හෝ ගොනු නාම දිගුවක් (File name extention) යනු මයික්‍රොසොෆ්ට් වින්ඩෝස් වැනි මෙහෙයුම් පද්ධතිවල ගොනු වර්ගය හඳුනා ගැනීමට උපකාරී වන්නකි. බොහෝ විට මෙය තිතකින් (·) පසුව අක්ෂර දෙකකින් හෝ තුනකින් සමන්විත වේ.

## ක්‍රියාකාරකම 4.5

- ඔබට සපයන ලද විවිධ ගොනු ආකෘති, ශ්‍රව්‍ය ගොනු (File format), ශ්‍රව්‍ය සංස්කරණය කිරීමේ මෘදුකාංගයට ආයාත (Import) කරන්න.
- එම ගොනු අතරින් ශ්‍රව්‍ය සංස්කරණ මෘදුකාංගය සඳහා ආයාත කළ හැකි ගොනු ආකෘති සහ නොහැකි ගොනු ආකෘති ලැයිස්තු ගත කරන්න.

(මිනිත්තු 50යි)

## අභ්‍යාසය 4.5.1

පහත කොටුවේ සඳහන් කර ඇති ගොනු ආකෘති අතුරින් ශ්‍රව්‍ය ගොනු ආකෘති තෝරා ලියන්න.

| | | | |
|---|---|---|---|
| .pdf | .doc | .mp3 | .wmv |
| .pptx | . midi | . wave | .xlsx |

.......................................................................................................

.......................................................................................................

### ඔබගේ දැනුමට

- File → Import → Audio → අදාළ ශ්‍රව්‍ය ගොනුව හෝ ගොනු තෝරා ගැනීම → Open බොත්තම මත ක්ලික් කිරීම.




- Audacity මෘදුකාංගය විවෘත කර එම කවුළුවට (Window) ශ්‍රව්‍ය ගොනුව හෝ ගොනු ඇදගෙන ගොස් අත හැරීම (Drag and drop)
- Audacity අයිකනය (icon) මතට ශ්‍රව්‍ය ගොනුව හෝ ගොනු ඇදගෙන ගොස් අත හැරීම (Drag and drop)

## ක්‍රියාකාරකම 4.6

- ඔබට ලබා දෙන ලද ශ්‍රව්‍ය ගොනුව ශ්‍රව්‍ය සංස්කරණ මෘදුකාංගයට ආයාත (Import) කර ගන්න.
- තරංග ආකෘතිය (Waveform) හොඳින් නිරීක්ෂණය කරන්න.
- ආයාත (Import) කරන ලද හඬට (Audio) සවන් දෙන්න.
- ඔබේ ශ්‍රව්‍ය පථයෙන් (Audio track) ආසන්න වශයෙන් තත්පර 10ක කොටසක් වෙන් කර ගන්න (Trim)
- ඔබේ නව ශ්‍රව්‍ය පථය පරීක්ෂා කරන්න (Test)
- නව ශ්‍රව්‍ය පථය සුරකින්න (Save)
- නව ශ්‍රව්‍ය පථය නිර්යාත (Export) කරන්න.
- නිර්යාත (Export) කර ගත් ශ්‍රව්‍ය ගොනුව ධාවනය කර (play) සවන් දෙන්න. (මිනිත්තු 50යි)

### ඔබගේ දැනුමට

- WAV, MP2, MP3, FLAC යනු ශ්‍රව්‍ය ගොනු ආකෘති වර්ග (Sound File Formats) කිහිපයකි. මෙම ගොනු ආකෘතිවලින් යුක්ත ශ්‍රව්‍ය ගොනු, ශ්‍රව්‍ය ධාවන මෘදුකාංගයක් (Sound Play Software) මගින් ශ්‍රවණය කළ හැකි ය.
- ශ්‍රව්‍ය ගොනුවක් නිර්යාත (Export) කර, ශ්‍රව්‍ය ගොනු ධාවන (Play) මෘදුකාංගයක් (Sound Play Software) මගින් ශ්‍රවණය කළ හැකි ය.

1. ශ්‍රව්‍ය පථයෙන් අවශ්‍ය කොටස තෝරා ගැනීම
2. ඉන් පසු Edit→Remove Special →Trim Audio



**ශ්‍රව්‍ය ගොනු නිර්යාත (Export) කිරීම.**

1. File → Export →Export Audio
2. ගොනුව තැන්පත් කරන ස්ථානය තෝරා ගොනුවට සුදුසු නමක් ලබා දීම.
3. අවශ්‍ය ගොනු ආකෘතිය (Save as Type) තුළින් තෝරා ගැනීම.
4. Save බොත්තම ක්ලික් කිරීම.
5. ඉන්පසු විවෘත වන Edit Metadata Tags සංවාද කොටුව උපයෝගී කර ගනිමින් ශ්‍රව්‍ය සංධාරය පිළිබඳ විස්තර ඇතුළත් කොට OK ක්ලික් කරන්න.






**ප්‍රායෝගික පුහුණුව**

**ශ්‍රව්‍ය ගොනුවක අවසාන කොටසෙහි හඬ ක්‍රමයෙන් අඩු කිරීම (Fade out)**

- ඔබ විසින් නිර්මාණය කර ගත් ශ්‍රව්‍ය ගොනුව, ශ්‍රව්‍ය සංස්කරණ මෘදුකාංගය මගින් විවෘත කර ගන්න.
- එය ධාවනය කර (Play) හොඳින් සවන් දෙන්න.
- ශ්‍රව්‍ය පථයේ අවසන් කොටසෙහි තරංග ආකෘතිය (Waveform) හොඳින් නිරීක්ෂණය කරන්න.
- ශ්‍රව්‍ය පථයේ අවසන් කොටසෙහි හඬ ක්‍රමයෙන් අඩු කරන්න. (Fade out)
- තරංගයේ සිදු වන වෙනස්කම් නිරීක්ෂණය කරන්න.
- නැවත ශ්‍රව්‍ය පථය ධාවනය කර (Play) හොඳින් සවන් දෙන්න.
- නව ශ්‍රව්‍ය පථය සුරකින්න (Save).
- නව ශ්‍රව්‍ය පථය නිර්යාත (Export) කරන්න.

## ඔබගේ දැනුමට

**ශ්‍රව්‍ය ගොනුවක අවසාන කොටසෙහි හඬ ක්‍රමයෙන් අඩු කිරීම**
(Fade out)

- Skip to End මෙවලම භාවිතයෙන් ශ්‍රව්‍ය පථයේ අවසානයට ගමන් කිරීම
- තරංග ආකෘතියේ අවසාන තත්පර දෙක තුන ඔබට පෙනෙන තුරු විශාලනය කිරීම
- අවසාන තත්පර එකක් හෝ දෙකකට පමණ පෙර තරංග ආකෘතිය මත ක්ලික් කිරීම
- ඉන්පසු Select → Region → Cursor to Track End (පෙර ක්ලික් කර) ස්ථානයේ සිට තරංගයේ අවසානය දක්වා ප්‍රදේශය තෝරා ගැනීම (Select) ඉන්පසු Effect → Fade Out විලාසය යෙදීම



Fade in කිරීමට පෙර



Fade Out කිරීමට පසු

## පෙර සූදානම

- පහත ක්‍රියාකාරකම සඳහා ඔබ තෝරා ගන්නා මාතෘකාවට අදාළව පටිගත කිරීමට අවශ්‍ය දේ (උදාහරණ: ගීත ඛණ්ඩයක්, ගාථාවක්) පැහැදිලිව කොළයක ලියාගෙන එන්න.

## ක්‍රියාකාරකම 4.7

- පන්තිභාර ගුරුතුමා හෝ ගුරුතුමියගේ අධීක්ෂණය යටතේ පාසලේ පරිපාලන කටයුතුවලට සහාය වීම සඳහා සුදුසු ශ්‍රව්‍ය ගොනුවක් නිර්මාණය කරන්න.
- පාසලේ එක් එක් කාලච්ඡේද ආරම්භ වීමේ දී ධාවනය කළ හැකි පාසලට ම ආවේණික වූ ශ්‍රව්‍ය පසුරක් නිර්මාණය කිරීම.
- පාසලේ විවේක කාලයේ දී හෝ පාසල ආරම්භ වීමට ප්‍රථම ශ්‍රවණය වීමට සැලැස්විය හැකි අධ්‍යාපනික වටිනාකමකින් යුතු ශ්‍රව්‍ය පසුරක් නිර්මාණය කිරීම.
- උදෑසන හා සවස ආගමික වතාවත් සිදු කිරීමට සහාය දැක්වීම සඳහා ශ්‍රව්‍ය පසුරක් නිර්මාණය කිරීම. (මිනිත්තු 50යි)

### ඔබගේ දැනුමට

**ශ්‍රව්‍ය ගොනු කොටස් කිහිපයක් එකට එක් කරමින් නව ශ්‍රව්‍ය ගොනුවක් නිර්මාණය කිරීම.**

- අවශ්‍ය ශ්‍රව්‍ය ගොනු කිහිපය එකවර ශ්‍රව්‍ය සංස්කරණ මෘදුකාංගයට ආයාත (Import) කර ගත හැකි ය.
- File → Import→Audio →අවශ්‍ය ශ්‍රව්‍ය ගොනු කිහිපය එකවර තෝරන්න.→ Open බොත්තම මත ක්ලික් කර ගත හැකි ය.
- අවශ්‍ය ශ්‍රව්‍ය ගොනු කිහිපය එකවර තේරීමට, යතුරු පුවරුවේ **Ctrl** යතුර ඔබාගෙන අවශ්‍ය ගොනුමත ක්ලික් කිරීම.
- යතුරු පුවරුවේ Shift යතුර ඔබා ගෙන අවශ්‍ය ගොනු මත ක්ලික් කිරීම, ආදිය මගින් සිදු කළ හැකි ය.
- නව ශ්‍රව්‍ය පථයක් ලබා ගැනීමට, Tracks →Add New→Stereo Track භාවිත කළ හැකි ය.
- එක කවුළුවක් තුළ දර්ශනය වන ශ්‍රව්‍ය පථවල (Audio Tracks) පෙනෙන පරාසය අවශ්‍ය පරිදි සකසා ගත හැකි ය.

- ශ්‍රව්‍ය පථ (Audio Tracks) ඉවත් කළ හැකි ය.




- පථ පාලන මණ්ඩලය (Track Control Panel) මගින් අනවශ්‍ය ගීතවල හඬ තාවකාලික ව නිහඬ (Mute) කර තබා ගත හැකි ය.




- පථ පාලන මණ්ඩලයේ (Track Control Panel) ඇති, Close පහසුකම භාවිතයෙන් අනවශ්‍ය පථ ඉවත් කළ හැකි ය.



ශ්‍රව්‍ය ගොනුවක් හෝ ගොනු සඳහා විලාස (Effects) යෙදීම.

- ඔබ විසින් පෙර ක්‍රියාකාරකම්වල දී නිර්මාණය කර ගත් හඬ පටය, ශ්‍රව්‍ය සංස්කරණ මෘදුකාංගය මගින් විවෘත කර ධාවනය කරමින් (Play) හොඳින් සවන් දෙන්න.

- ශ්‍රව්‍ය පථයේ ගැළපෙන ස්ථානවලට පහත දක්වා ඇති විලාස (Effects) යොදමින් තරංගයේ සහ හඬෙහි සිදුවන වෙනස්කම් නිරීක්ෂණය කර ගත හැකි ය.

- Fade In (ශ්‍රව්‍ය පථයේ මුල් කොටසට)
- Fade Out (ශ්‍රව්‍ය පථයේ අවසාන කොටසට)
- Speed (ශ්‍රව්‍ය පථයේ මධ්‍යයේ තෝරා ගත් කොටසකට)
- Echo (ශ්‍රව්‍ය පථයේ මධ්‍යයේ තෝරා ගත් කොටසකට)
- ගීතය නැවත ධාවනය කර (Play) හොඳින් සවන් දී අවශ්‍ය පරිදි තවත් විලාස (Effect) ඇතුළත් කරමින් සිදු වන වෙනස්කම් අධ්‍යයනය කර ගත හැකි ය
- එලෙස සකසා ගත් නව ශ්‍රව්‍ය පථය සුරැකිය හැකි ය (Save)
- නව ශ්‍රව්‍ය පථය නිර්යාත (Export) කර ගත හැකි ය



විලාස ඇතුළත් කිරීමට පෙර



විලාස ඇතුළත් කිරීමෙන් පසු

| ස්වයං තක්සේරුකරණය | | |
|---|---|---|
| තක්සේරුකරණ නිර්ණායකය<br>■ ශබ්ද උපාංග නිවැරදිව සම්බන්ධ කිරීම | | |
| ඔබට ඉටු කළ හැකි කාර්යයන් ඉදිරියේ ඇති කොටුවේ "✓"සලකුණ යොදන්න. | | |
| | කාර්යයන් | "✓"සලකුණ |
| ඕඩැසිටි | 1. හඬ පටයක අනවශ්‍ය ශබ්ද හඳුනා ගැනීමට මට පුළුවනි. | |
| | 2. පටිගත කළ හඬ පටයක් ගබඩා කර නැවත ධාවනය කිරීමට මට පුළුවනි. | |
| | 3. ශ්‍රව්‍ය සංස්කරණ මෘදුකාංගයක් තෝරා ගෙන හඬ පටයක් විවෘත කිරීමට මට පුළුවනි. | |
| | 4. ශ්‍රව්‍ය සංස්කරණ මෘදුකාංගයක් හඬ පටයක් කොටස්වලට වෙන් කිරීමට මට පුළුවනි. | |
| | 5. ශ්‍රව්‍ය ගොනුවක් ශ්‍රව්‍ය සංස්කරණ මෘදුකාංගයකට ආයාත කිරීමට මට පුළුවනි. | |
| | 6. සංස්කරණය කළ හඬ පටයක් ගබඩා කිරීමට මට පුළුවනි. | |
| | 7. හඬ පටයක තරංග ආකෘතිය දෙස බලා හඬෙහි උස්පහත්කම් හඳුනා ගැනීමට මට පුළුවනි. | |
| "✓"සලකුණු ගණන | | |
| ඔබට හිමි ලකුණු ගණන | | ......... /5 |

| | |
|---|---|
| "✓" ලකුණු ගණන 6 හෝ ඊට වැඩි නම් | ඉතා හොඳයි (ලකුණු 5යි) |
| "✓" ලකුණු ගණන 4 හෝ ඊට වැඩි නම් | හොඳයි (ලකුණු 4යි) |
| "✓" ලකුණු ගණන 3 නම් | අපේක්ෂිත ඉලක්කයට ආසන්නයි (ලකුණු 3යි) |
| "✓" ලකුණු ගණන 2 නම් | සංවර්ධනය විය යුතුය |

| පරිගණක තාක්ෂණයට අදාළ මූලික සංකල්ප තේරුම් ගනිමු. | |
|---|---|
| මෘදුකාංග (Software) | මෘදුකාංග යනු පරිගණක ක්‍රියාත්මක කිරීමට සහ විශේෂිත කාර්යයන් ඉටු කිරීමට භාවිත කරන උපදෙස්, වැඩ සටහන් හෝ දත්ත සමූහයකි. |
| ශ්‍රව්‍ය (Audio) | ශ්‍රව්‍ය යනු සාමාන්‍යයෙන් ශබ්දයයි. එය සම්ප්‍රේෂණය, පටිගත කිරීම හෝ ප්‍රතිනිෂ්පාදනය කළ හැකි ය. |
| පටිගත කිරීම (Record) | මයික්‍රෆෝනයක් සහ පටිගත කිරීමේ උපකරණ (ප්‍රතිසම හෝ සංඛ්‍යාංක) භාවිතයෙන් ශබ්දය ග්‍රහණය කර ගබඩා කිරීම මගින් පටිගත කළ හැකි ය. එය පසුව සවන් දීමට හෝ නැවත සකස් කිරීමට හැකි ය. |
| ශ්‍රව්‍ය සංස්කරණ මෘදුකාංග (Audio Editing Software) | ශ්‍රව්‍ය සංස්කරණ මෘදුකාංග යනු සංඛ්‍යාංක ශ්‍රව්‍ය ගොනු, හැසිරවීමට සහ වෙනස් කර සකස් කිරීමට නිර්මාණය කර ඇති පරිගණක මෘදුකාංගයකි. |
| ශ්‍රව්‍ය ගොනු ආකෘති (Audio File Formats) | ශ්‍රව්‍ය ගොනු ආකෘති යනු සංඛ්‍යාංක ශ්‍රව්‍ය දත්ත ගබඩා කිරීමේ ක්‍රම වේ.<br><br>උදා - MP3, WAV, AAC, FLAC, AIFF,.. |
| පරිශීලක අතුරුමුහුණත (User Interface) | පරිශීලක අතුරුමුහුණතක් (UI) යනු පරිශීලකයෙකු සහ පරිගණක පද්ධතියක්, මෘදුකාංගයක් හෝ යෙදුමක් අතර අන්තර්ක්‍රියා කරන මුහුණතයි. |

| | |
|---|---|
| ආයාත කරන ලද ගොනු (Import File) | ගොනුවක් ආයාත කිරීම යනු එක් ගොනුවකින් දත්ත හෝ අන්තර්ගතය තවත් වැඩ සටහනකට, පද්ධතියකට හෝ ලේඛනයකට ගෙන ඒම වන අතර එමඟින් එය භාවිත කිරීමට හෝ සැකසීමට හැකි වේ. |
| නිර්යාත කරන ලද ගොනු (Export File) | ගොනුවක් නිර්යාත කිරීම යනු නිශ්චිත ගොනු ආකෘතියකට (File Format) අනුව වැඩ සටහනකින් දත්ත සුරැකීම හෝ පරිවර්තනය කිරීම වන අතර, එමඟින් එය වෙනත් වැඩ සටහනක භාවිත කිරීමට, බෙදා ගැනීමට (share) හෝ ගබඩා කිරීමට හැකි වේ. |
| නිදහස් හා විවෘත මූලාශ්‍ර මෘදුකාංග (Free and Open Source Software /FOSS) | නිදහස් හා විවෘත මූලාශ්‍ර මෘදුකාංග (FOSS) යනු මූලාශ්‍ර කේතය විවෘතව සහ නොමිලේ ලබා ගත හැකි, ඕනෑම කෙනෙකුට භාවිත කළ හැකි, වෙනස් කළ හැකි සහ බෙදා ගත (Share) හැකි මෘදුකාංග යකි. |
| කෙටිමං යතුරු (Shortcut Key) | කෙටිමං යතුරු යනු පරිගණක යතුරු පුවරුවක ඇති යතුරු සංයෝජනයන් වන අතර ඒවා නිශ්චිත ක්‍රියා හෝ විධානයන් සිදු කරයි. බොහෝ විට මූසිකයක් භාවිත කිරීමට හෝ මෙනු හරහා වැඩ කිරීමට වඩා වේගවත් වේ. |